# රංවල දේව සංකල්පය හා ජන ජීවිතය

බී.ඒ. සුමින්ද මධුභාෂණ බාලසූරිය*

ප්‍රාග් බෞද්ධ ලාංකික සමාජයෙහි පැවති ඇදහිලි හා විශ්වාස බුදු සමය එළඹීමෙන් පසු වුවද සම්පූර්ණයෙන් අභාවයට නොගොස් බෞද්ධාගමික දෙවිවරුන්ගෙන් සමන්විත දේව ධූරාවලියක් නිර්මාණය වීම දක්වා වර්ධනය වී ඇති ආකාරය ශ්‍රී ලංකාවේ දේව සංකල්පයේ පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීම හරහා සනාථ කර ගත හැකිවේ. මෙරටට බුදු දහම ලැබීමෙන් අනතුරුව ද දේව සංකල්පය මෙරට සමාජයෙන් ගිලිහි නොගොස් අඛණ්ඩව ඉදිරියට ගමන් ඇත්තේ ජන සමාජය කෙරෙහි දේව සංකල්පය බැඳී ඇති ආකාරය පසක් කරමිනි. ශ්‍රී ලංකාවේ දේව සංකල්පය දෙස අවධානය යොමු කරන විට එය යුගයෙන් යුගයට වෙනස් වෙමින් දේශීය හා විදේශීය ආභාසයන් හුරුකර ගනිමින් පෝෂණය වූවක් බව හඳුනාගත හැකි වේ. ඒ ආකාරයට දෙවිවරුන් මෙරට ජන සමාජයට වැදගත් වූ ආකාර ගණනාවක් හඳුනාගත හැකි වේ. තව ද දෙවිවරුන්ගේ බලය, සම්භවය, ව්‍යාප්තිය ආදී නොයෙකුත් කරුණු මත කොටස්වලින් යුක්ත දේව මණ්ඩලයක් හඳුනාගත හැකි අතර එම දේව මණ්ඩලය බුදුදහමට යටත් ව නිර්මාණය වී ඇති බවක් හඳුනාගත හැකි වේ. සතර වරම් දෙවිවරු, ප්‍රධාන දෙවිවරු, ප්‍රාදේශීය දෙවිවරු, ග්‍රාමීය දෙවිවරු, යක්ෂ කොටස්, ප්‍රේත සමූහය ආදී වශයෙන් කොටස් ලෙස හඳුනාගත හැකි වේ.

මෙහි වැදගත් ප්‍රාදේශීය දෙවි කෙනෙකු වශයෙන් රංවල දෙවියන් හඳුනාගත හැකි වේ. ආරම්භයේ කුඩා ගම්මාන කිහිපයක් තුළ ප්‍රචලිත ව පැවති මෙම දේව සංකල්පය අද්‍යතනය වනවිට විශාල වපසරියක ව්‍යාපත්ව පවතී. නූතනයේ සියනෑ හේවාගම් දෙකෝරලයෙහි කැළණි ගං මිටියාවතේ පදිංචි බොහෝ ජන ප්‍රමාණයක් මෙම දෙවියන් ඇදහීමට ලක් කරයි. ප්‍රාදේශීය සෙසු දෙවිවරුන් අභිභවා ප්‍රසිද්ධියට පත්ව ඇති මෙම දේව සංකල්පය බෞද්ධාගමික පසුබිමක පෝෂණය වී ඇති බව මෙම දේව සංකල්පයේ ප්‍රභවය පිළිබඳව අධ්‍යයනයේදී පැහැදිලි වේ. මෙහිදී මෙම අධ්‍යයනය හරහා ශ්‍රී ලංකාවේ දේව සංකල්පය ප්‍රාදේශීය දේව ඇදහිලි තෙක් වර්ධනය වීම කෙටියෙන් අධ්‍යයනය කර ඇති අතර රංවල දේව සංකල්පයේ ප්‍රභවය, රංවල දෙවියන් පිළිබඳව ජනයාගේ පවතින ආකල්ප හා විශ්වාස, රජවල දෙවියන් හා බැඳි ජනශ්‍රැති , රංවල දේව සංකල්පය මූලික කොට ගත් ජන ජීවිතය ආදී අධ්‍යයනයට ලක් කර ඇත. මෙම අධ්‍යයනයෙහි ක්‍රමවේදන් වශයෙන් ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය, ක්ෂේත්‍ර නිරීක්ෂන හා සම්මුඛ සාකච්ඡා සිදු කිරීම මූලික වේ. මෙම දේව සංකල්පය පිළිබඳව ලිය වී ඇති සාහිත්‍යමය කෘතීන්හි පවතින අල්ප වීම හරහා වැඩි අවධානයක් ක්ෂේත්‍රගත අධ්‍යයනය සඳහා යොමු කර ඇත. තවද සම්මුඛ සාකච්ඡා හරහා ජන ප්‍රවාද දත්තයන් කෙරෙහිද වැඩි අවධානයක් යොමු කර ඇත. මෙකී අධ්‍යයනයන් හරහා රංවල දේව සංකල්පයේ ස්වභාවය සහ එය ජන ජීවිතයට බැඳි ඇති ආකාරය පැහැදිලි කර ගත හැකි වේ.

ප්‍රමුඛ පද- රංවල දෙවියන්, දේව සංකල්පය, දේව ඇදහිලි

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්ව විද්‍යාලය sumindamadubashana22@gmail.com